# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2013/14
2017 අප්‍රේල් - ජූනි
මානවශාස්ත්‍ර පීඨය

**බෞද්ධ දර්ශනය - BUPH - E 2025**

**බෞද්ධ දර්ශනය පාරභෞතික ප්‍රස්තුත හා සමයාන්තර චින්තා**

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව සකස්ව තිබූ බුද්ධකාලීන භාරතීය සමාජය, ගුණාත්මකව පරිවර්තනය කිරීමට බුදුරදුන් විසින් දරණ ලද උත්සාහය මූලාශ්‍රය ඇසුරෙන් පෙන්වා දෙන්න.

02. "සාර්ථක ගෘහස්ථ ජීවිතයක් පිණිස ආර්ථික සමෘද්ධිය අත්‍යවශ්‍ය සාධකයක් ලෙස අවධාරණය කරන බුදුසමය එය ධාර්මික පදනමක් මත සපුරාගත යුතු බව පෙන්වා දෙයි." සූත්‍රගත දේශනා නයින් සනාථ කරන්න.

03. පවුල් සංස්ථාවේ සුරක්ෂිතතාව පිණිස සිගාලෝවාද සූත්‍රාගත යුතුකම් හා වගකීම් ඉවහල් වන අයුරු පැහැදිලි කරන්න.

04. ජනහිතකාමී පාලන තන්ත්‍රයක් නිර්මාණය කර ගැනීම බෞද්ධ දේශපාලන මූලධර්මවල මුඛ්‍ය පරමාර්ථය බව මූලාශ්‍රය සාධක මගින් පෙන්වා දෙන්න.

05. සාමයික සහජීවනය හා සහනශීලීතාව පිණිස බෞද්ධ ඉගැන්වීම්වලින් ලැබිය හැකි පිටිවහල ප්‍රමාණ කරන්න.

06. ආත්මවාදය පිළිබඳ බුදුසමයේ ආකල්පය අනාත්මවාදී සිද්ධාන්තය ඇසුරෙන් පැහැදිලි කරන්න.

07. පුනරුප්පත්තිය පිළිබඳ බුද්ධකාලීන භාරතීය ආගමික විශ්වාස බෞද්ධ පුනර්භව සංකල්පයට සාපේක්ෂව විමර්ශනය කරන්න.

08. පාරභෞතික ප්‍රස්තුත පිළිබඳ බෞද්ධ ආකල්පය දශ අව්‍යාකෘත ප්‍රශ්න ඇසුරෙන් ගෙනහැර දක්වන්න.

09. නිවන පිළිබඳ බෞද්ධ විග්‍රහය පාරභෞතික සංකල්පවලින් විනිර්මුක්තවූවක්දැයි මූලාශ්‍රය නයින් පරීක්ෂා කරන්න.

10. වර්තමාන සමාජ ගැටලු දෙකක් හඳුනාගෙන, ඒවා නිරාකරණයෙහිලා බෞද්ධ ඉගැන්වීම් උපයෝගී කොට ගත හැකි අයුරු පැහැදිලි කරන්න.

**********************